# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2258/50 – 2021 දෙසැම්බර් 17 වැනි සිකුරාදා – 2021.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටපොත (කඩුවෙල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KDW/2017/455 හා 2017.11.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'C' – හිග්ගහවත්ත – ප්‍රමාණය: **හෙක්. 0.0410ක් පමණ**

උතුරට: ශ්‍රී යෝගාශ්‍රම මාවත සහ මාර්ගය; නැගෙනහිරට: ඉන්දික වේරගල හිමිකම් කියන හිග්ගහවත්ත සහ පාර; දකුණට: පාර; බටහිරට: පාර සහ ශ්‍රී යෝගාශ්‍රම මාවත.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/WS/533.
2021 නොවැම්බර් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 - 0182


1A – G 35591 – 25 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රග්ගහවත්ත (කඩුවෙල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KDW/2017/457 හා 2017.11.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – වරි. අංකය සොයාගත නොහැක, නුවර පාර – ප්‍රමාණය: හෙක්. 0.5514ක් පමණ**

උතුරට: මංජුල පලිහේන, එල්. රාජපක්ෂ හිමිකම් කියන වරි. අංක සොයාගත නොහැකි ඉඩම සහ කැලණි ගඟ; නැගෙනහිරට: කැලණි ගඟ, ගෝඩුන්න වඩුගේ ප්‍රභාත් පුෂ්ප කුමාර සහ තවත් අය හිමිකම් කියන වරි. අංකය සොයාගත නොහැකි ඉඩම; දකුණට: නුවර පාර සහ ඩී. එල්. පී. පලිහේන සහ තවත් අය හිමිකම් කියන වරි. අංකය සොයාගත නොහැකි ඉඩම; බටහිරට: ඩී. එල්. පී. පලිහේන සහ තවත් අය, මංජුල පලිහේන, එල්. රාජපක්ෂ හිමිකම් කියන වරි. අංක සොයාගත නොහැකි ඉඩම.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/WS/554.
2021 ඔක්තෝබර් මස 07 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 - 0183